# ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපනය සඳහා නව එළඹුම්

**- මහාචාර්ය පූජ්‍ය වරදිවෙල විජයසුමන හිමි**

## ප්‍රවේශය

ශ්‍රී ලාංකේය භික්ෂු අධ්‍යාපන සම්ප්‍රදාය හා අත්‍යන්තයෙන්ම බැඳී පවත්නා අධ්‍යාපන ආයතනය ''පිරිවෙන'' නමින් හැඳින්වේ. මෙය විශ්වීය දැනුම පරිවහනය කෙරෙන ස්ථානය වූ හෙයින් පරිවහනය යන්න පසුව පිරිවෙන ලෙසින් භාවිතයට පත්වූ බව පැහැදිලිය. මිහිඳු මහ රහතන්වහන්සේගේ ලංකාගමනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් අනුරාධපුර යුගයේදී මහා විහාරය කේන්ද්‍රීයව ශ්‍රී ලාංකේය භික්ෂු අධ්‍යාපනයෙහි ප්‍රභවය සිදුවිය. මෙලෙස ආරම්භ වූ භික්ෂු අධ්‍යාපන සම්ප්‍රදාය විවිධ කාල වකවානුවලදී උන්නතීන්ට හා අවනතීන්ට ලක්වෙමින් විකාශනය විය. මහනුවර යුගය වන විට එහි පරිහානියේ උච්චතම අවධියට එළඹ පැවැති බව ප්‍රකටය. වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ දැඩි උත්සාහයෙන් උඩුනුවර නියමකන්ද නම් ස්ථානයේ දී නැවතත් භික්ෂු අධ්‍යාපන ක්‍රියාවලිය ආරම්භ වූ බව ඓතිහාසිකව සනාථ වේ. පසුකාලීනව ආරම්භ කළ විද්‍යෝදය හා විද්‍යාලංකාර මහ පිරිවෙන් නූතන භික්ෂු අධ්‍යාපන සම්ප්‍රදායෙහි ඓතිහාසික සන්ධිස්ථානයක් ලෙස සම්භාවිතය. මෙම විද්‍යාස්ථාන ආශ්‍රිතව ආරම්භ වූ ශාඛා ප්‍රශාඛා මගින් පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත වූ බව පැහැදිලිය.

මෙලෙස පිරිවෙන් ආශ්‍රිතව ව්‍යාප්තව අද දක්වාත් පැවත එන භික්ෂු අධ්‍යාපන සම්ප්‍රදාය පිළිබඳව විවිධ සාධනීය හා නිෂේධනීය විවේචන සහිත මතවාද මේ වන විට පළවෙමින් පවතී. විශේෂයෙන් මුල්කාලීන පිරිවෙන් දේශීය සංස්කෘතිය මැනවින් සංරක්ෂණය කරලමින්, පාසල් අධ්‍යාපන සම්ප්‍රදායට අභියෝග කරමින්, විවිධ විෂයයන්හි ප්‍රාමාණික විද්වතුන් සමූහයක් බිහිකරලීමට දායක විය. පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදායෙහි මෑත කාලීනව සිදුවූ වෙනස්වීම් එහි පැවැති සම්භාව්‍ය සාම්ප්‍රදායිකත්වය ගිලිහීයාම සඳහා උපස්ථම්භක වූ බවට ද මතවාද පළවේ.[1] මෙම සියලු සාධක පිළිබඳව අවධානය යොමුකරමින් පිරිවෙන් අධ්‍යාපන ක්ෂෙත්‍රය විෂයයෙහි සාධනීය වෙනස්කම් ජනිත කරලීම සඳහා උචිත වූ නව එළඹුම් කවරේදැයි විමර්ශනාත්මක අධ්‍යයනයක නිරතවී යෝජනා ඉදිරිපත් කරලීම මෙම පර්යේෂණයේ ප්‍රස්තුතය වන්නේය.

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය භික්ෂු අධ්‍යාපනය පිළිබඳව ප්‍රමුඛතම කාර්යභාරය ඉටුකරනු ලබන්නේ "පිරිවෙන" නම් වූ අධ්‍යාපන ආයතනය මගිනි. භික්ෂු අධ්‍යාපනයෙහි මූලිකම අරමුණ වන්නේ පැවිදි ජීවිතයට ප්‍රවේශ වූවන් ධර්ම විනයානුකූලව හැඩගැස්වීම හා ඔවුන් නිර්වාණ මාර්ගයෙහි නියුක්ත කරවීමත්ය. එමෙන්ම ධර්මධර, විනයධර පැවිද්දන් ලෙස සුපේශල ශික්ෂාකාමී ආකල්ප සම්පත්තියෙන් සමන්විතව තමන් උගත් දෑ සමස්ත සමාජය වෙත සම්ප්‍රේෂණය කොට, ඔවුන් එම ශික්ෂා මාර්ගයෙහි අනුයෝජනය කරවීම බව පැහැදිලිය.[2] ශාසනික හා පාරිභාෂික අර්ථයෙන් භික්ෂු අධ්‍යාපනයේ පරමාර්ථය වන්නේ පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයෙහි අනුයුක්තව නිර්වාණය සාක්ෂාත්කරණය ලෙස සැලකීම යුක්ති යුක්ත ප්‍රවේශයකි.

අනුරාධපුර මහා විහාර භික්ෂු පරපුරෙන් ආරම්භ වූ ශ්‍රී ලාංකේය භික්ෂු අධ්‍යාපන සම්ප්‍රදාය[3] මේ වන විටත් සෑහීමකට



පත්විය හැකි මට්ටමේ සේවාවක් ඉටුකරනු ලබන බව සත්‍යයකි. අතීත ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපනය ගිහි පැවිදි දෙපක්ෂයේම අධ්‍යාපන ආයතනය ලෙස ක්‍රියාත්මක වූ බව පෙනේ. ගිහි පැවිදි දෙපක්ෂයේම ශාස්ත්‍රාභිලාෂය සාධනයෙහිලා විශිෂ්ට සේවාවක් ඉටුකළ පිරිවෙන් ආයතන එවකට ශ්‍රී ලාංකේය අධ්‍යාපනය පිළිබඳ කේන්ද්‍රස්ථානය ලෙස ඇගයීමට ලක්වූ බවද සිහිපත් කරගත යුතු වැදගත් සාධකයකි. ඒ බව පහත උද්ධෘතයෙන් මනාව විශද වේ.

"ලංකාවේ දිශා විදිශාවන්හි ව්‍යාප්ත වී පැවති ඒ පිරිවෙන්වල බොහෝ දේශීය හා විදේශීය ගිහි ශිෂ්‍යයෝද ශාස්ත්‍රෝද්ග්‍රහණය කළෝය. ධර්ම ප්‍රචාරය අතින් සලකන කල එයින් බිහිවූ ශිෂ්‍යයෝ බෙහෙවින් ප්‍රභාවත් ප්‍රවීණයෝ වූහ. ආත්ම ලාභයට වඩා ශාසනයේ චිරස්ථිතියත්, ජනතා අභිවෘද්ධියත් ඔවුන්ගේ කුටුම්භයන් ලෙස ඔවුහු සංරක්ෂණය කළහ.........දේශීය සංස්කෘතිය මනා ලෙස රැකගනිමින් පාඨශාලා ක්‍රමය සමග ඉතා ප්‍රාණවත් ලෙස පාලකයන්ට අභියෝග කිරීමට සමත් විවිධ විෂයයන්හි ප්‍රවීන වූ වියතුන් හා ජනනායකයන් බිහිකළේය. ජාතියේ මුර දේවතාවා ලෙස ගුණ නුවණින් පොහොසත් වූ භික්ෂූන් වහන්සේ රටවැසියන්ට නිසිමග කියාදුන්හ."[4]

මෙම විශිෂ්ට සාධනීය ලක්ෂණ වර්තමාන පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය තුළ තවදුරටත් විද්‍යමාන වන බවක් නොපෙනේ. එහෙයින් යම් සාධනීය ප්‍රවේශයක් කරා එළඹීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග විමර්ශනය සඳහා කාලය එළඹ ඇති බව පැහැදිලිය.

## වර්තමාන ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

පිරිවෙන් අධ්‍යාපනයේ මූලික පරමාර්ථ 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනතෙහි පහත සඳහන් අයුරින් දැක්වේ.

1. පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

2. සැරියුත් මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්නව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, විනයගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

3. දේශීය හා විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන්ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරතවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම.

4. බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබාගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සැලසීම.[5]

මෙම පරමාර්ථ සාධනයෙහිලා වර්තමාන පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විශේෂ අවධානය යොමුකරමින් ඵලදායි ආයතනයක් ලෙස පිරිවෙන යළි නගා සිටුවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුව පවතී.

## වර්තමාන පිරිවෙන්හි ආයතනික සැකැස්ම

වර්තමාන පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය ආයතනික වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.[6]

1. මූලික පිරිවෙන
2. මහා පිරිවෙන
3. පිරිවෙන් විද්‍යායතන

## මූලික පිරිවෙන

මූලික පිරිවෙන පිළිබඳ නියමයන් පහත සඳහන් පරිදි දැක්වේ.

(අ.) මූලික පිරිවෙනක අධ්‍යයන පාඨමාලාවක කාලසීමාව අවුරුදු පහක් විය යුතු අතර පළමු වර්ෂ දෙක අනිවාර්යයෙන්ම හෙරණ පැවිදි බණ දහම්, සේඛියා සහ වත් පිරිත් ආදිය ප්‍රගුණ කරවීම, පැවිදි වත් පිළිවෙත්හි



හික්මවීම සහ ලේඛනය හා උච්චාරණ විධි පුහුණුව ලබා දිය යුතුය.

(ආ.) එවැනි පිරිවෙනක නාම ලේඛනයෙහි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා දොළොස් නමකට නොඅඩු සංඛ්‍යාවක් සිටිය යුතුය.

(ඇ.) වයස අවුරුදු දාහතරට වැඩි වූද ආණ්ඩුවේ පාසලක පස්වන පන්තියෙන් සාමර්ථ්‍යය ලබා ඇත්තාවූ ද ගිහි ශිෂ්‍යයන් එවැනි පිරිවෙනකට ඇතුළත් කරගත හැකිය.

(ඈ.) සාමාන්‍ය අධ්‍යාපනයේ කණිෂ්ඨ ද්විතීය පියවරෙහි යම් ශිෂ්‍යයෙකු කලින් ලබාගත් ශාස්ත්‍රීය සාමර්ථ්‍යයක් සැලකිල්ලට භාජනය කරමින් මූලික පිරිවෙනේ අධිපතින් වහන්සේගේ අභිමතය පරිදි පළමු වර්ෂ දෙක තුළදී නියමිත පුහුණුව හා ශික්ෂා හැරෙන්නට නියමිත පස් අවුරුදු පාඨමාලාව වර්ෂ එකකින් හෝ දෙකකින් අඩු කරනු ලැබිය හැකිය.

(ඉ.) මූලික පිරිවෙනක පහත සඳහන් අනිවාර්යය හා වෛකල්පික විෂයයන් ඉගැන්විය හැකිය.[7]

| අනිවාර්ය විෂයමාලාව | වෛකල්පික විෂයමාලාව |
|---|---|
| ▪ පාලි | ▪ ඉතිහාසය |
| ▪ සිංහල | ▪ භූගෝලවිද්‍යාව |
| ▪ සංස්කෘත | ▪ සමාජවිද්‍යාව |
| ▪ ත්‍රිපිටක ධර්මය (සූත්‍ර අභිධර්ම විනය) | ▪ සෞඛ්‍යවිද්‍යාව |
| ▪ ඉංග්‍රීසි | ▪ හින්දි |
| ▪ ගණිතය | ▪ දෙමළ හා පිරිවෙන් අධ්‍යයන මණ්ඩලය විසින් අනුමත කළ හැකි වෙනත් විෂයයන් |

අනිවාර්ය විෂයයන්ට අමතරව වෛකල්පික විෂයයන් දෙකකට නො අඩු සංඛ්‍යාවක් මූලික පිරිවෙනේදී ඉගැන්විය යුතුය.

## මහ පිරිවෙන

මහ පිරිවෙන සඳහා නියමයන් මෙසේය.[8]

(අ.) මහ පිරිවෙනක නාම ලේඛනයෙහි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විසිපස් නමකට නොඅඩු සංඛ්‍යාවක් සිටිය යුතුය.

(ආ.) මහ පිරිවෙනක උපරිම අධ්‍යයන කාල සීමාව ඒ පිරිවෙනේ විභාග සඳහා පවත්වනු ලබන පංති අනුව මණ්ඩලය විසින් කලින් කල තීරණය කළ යුතුය.

(ඇ.) පහත සඳහන් විභාගසඳහා මහ පිරිවෙනක පංති පැවැත්විය හැක.

i. ප්‍රාචීන භාෂෝපකර සමිතිය විසින් පවත්වනු ලබන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාග

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය.

iii. මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි ඒ හා සමාන මට්ටමේ වෙනත් විභාග.

iv. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකර සමිතිය විසින් පවත්වනු ලබන විභාග සඳහා නියම කොට ඇති පාඨමාලා සහ නියමිත විෂයමාලා නිර්දේශයන්ට අනුකූල වනසේද, ත්‍රිපිටකය, පාලි, සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි හා ගණිතය සම්බන්ධයෙන් ද, ශිෂ්‍යයන්ගේ විෂය ඥානය ක්‍රමානුකූලව වර්ධනය වන සේද පංති සංවිධාන කළ යුතුය. පහත සඳහන් අතිරේක විෂයයන් හැදෑරීම සඳහා ද පහසුකම් සැලැස්විය යුතුය. එනම් දර්ශනය, ආගම් ඉතිහාසය, වාග් විද්‍යාව, ආයුර්වේදය, හස්ත කර්මාන්තය, ප්‍රතිමා ශිල්පය හා ජ්‍යොතිෂ ශාස්ත්‍රය යන විෂයයන්ය.



## පිරිවෙන් විද්‍යායතන

පිරිවෙන් විද්‍යායතන සම්බන්ධ නියමයන් මෙසේය.

(අ.) පිරිවෙන් විද්‍යායතනයක ශිෂ්‍යයන් සියයකට නොඅඩු සංඛ්‍යාවක් සිටිය යුතු අතර මින් විසිපහකට නො අඩු සංඛ්‍යාවක් භික්ෂූන් වහන්සේලා විය යුතුය.

(ආ.) පහත සඳහන් විභාග සඳහා පංති පැවැත්විය හැකිය.

i. ප්‍රාචීන භාෂෝපකර සමිතිය විසින් පවත්වනු ලබන මධ්‍යම හා අවසාන විභාග.

ii. මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග.

iii. මණ්ඩලය විසින් අනුමත කළ හැකි පිළිගත් විශ්වවිද්‍යාලයක යම් විභාග.

iv. මීට අමතරව මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි යම් අතිරේක විෂයයන් සඳහා ද පංති පැවැත්විය හැකිය.

## පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ දුබලතා හඳුනාගැනීම හා නව එළඹුම් යෝජනා කිරීම

### *සාම්ප්‍රදායිකත්වය ගිලිහීයාම හා නූතනත්වයට යොමුවීම*

මේ වන විට ශ්‍රී ලංකාවෙහි පිරිවෙන් අධ්‍යාපනය ප්‍රමාණාත්මක වශයෙන් යම් වර්ධනයක් පෙන්නුම් කරන බව පැහැදිලිය. 1979 පිරිවෙන් අධ්‍යාපන පනත යටතේ පිරිවෙන් ගුරුවරුන් සඳහා රජයේ වැටුප් ගෙවීම, පිරිවෙන් ගුරු සේවාවක් ආරම්භ කිරීම, ශිෂ්‍ය සංඛ්‍යාව මත ලබාදෙන වාර්ෂික ආධාර මුදල් ප්‍රමාණය වැඩිකිරීම ආදි සාධක මත පදනම්ව ප්‍රමාණාත්මක වශයෙන් පිරිවෙන් සංඛ්‍යාවේ වර්ධනයක් සිදුවී ඇත.

2013 වන විට රජයේ අනුමත පිරිවෙන් සංඛ්‍යාව

| පළාත | පිරිවෙන් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර පළාත | 152 |
| දකුණු පළාත | 162 |
| මධ්‍යම පළාත | 105 |
| ඌව පළාත | 62 |
| සබරගමුව පළාත | 89 |
| වයඹ පළාත | 93 |
| උතුරු මැද පළාත | 56 |
| නැගෙනහිර පළාත | 22 |
| උතුරු පළාත | 02 |
| මුළු එකතුව | 743 |

*(මූලාශ්‍රය :- සිය වසරක කාර්යභාරය දස වසරකින් 2005 - 2014, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනය, 2014)*

මෙම සංඛ්‍යාත්මක වර්ධනය සඳහා පූර්වෝක්ත සාධක හේතු වී ඇති අතර, එහි අනිටු විපාක වශයෙන් වියත්, සුපේශල ශික්ෂාකාමී මහා තෙරවරුන් වටා සිසුන් ඒකරාශීවීමෙ පැරණි සාම්ප්‍රදායික ක්‍රමය ගිලිහීයාමත්, හුදෙක් ආර්ථික ලාභාපේක්ෂාවෙන් පමණක්ම සිසුන් පැවිදි කරගනිමින් පිරිවෙන්හි ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි දියුණු කරගැනීමේ ප්‍රවණතාවක් මතුවී ඇත. පැවිදි කිරිමේ සාම්ප්‍රදායික සම්භාවිත ක්‍රමය වන විධිමත් පුහුණුවකින් පසු සිසුන් පැවිදිකිරීමේ ක්‍රමවේදය අභියෝගයට ලක්කරමින් ක්ෂණිකව පැවිදි කිරීමේ ක්‍රමවේයන්ද මේ තුළින් උද්ගතව ඇත.[9]

මූලික නවක පැවිද්දන් සඳහා මූලික පිරිවෙනේදී ලබාදිය යුතු මූලික ශික්ෂණය ලබාදීමේ සාම්ප්‍රදායික ක්‍රමවේදය ද බොහෝ පිරිවෙන්හි ක්‍රියාත්මක නොකෙරේ. මූලික පිරිවෙනෙහි පළමු වසර දෙක තුළදී ලබාදිය යුතු ශික්ෂණය වන හෙරණ පැවිදි බණ,



සේඛියා, වත් පිළිවෙත් හුරුකරවීම, වත පිරිත් කියවීම, ලේඛනය හා උච්චාරණය සඳහා පුරුදු කරවීම ආදි සාම්ප්‍රදායික පිළිවෙත්වලින් බැහැරවීම දුර්වලතාවක් ලෙස ගිණිය හැකිය.

පිරිවෙන් පිළිබඳ කළමනාකරණය ආයතන කේන්ද්‍රියවීම ද පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කරලීමේදී ප්‍රබල බාධකයක් ලෙස හඳුනාගත හැකිය. වර්තමාන පිරිවෙන් පරිපාලන ව්‍යූහය නිර්මාණය වී ඇත්තේ 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත අනුව හා එම පනතේ 26, 27 හා 33 යන වගන්ති යටතේ 1980 දී ප්‍රකාශයට පත් කෙරුණු නියෝග මගිනි.

මෙම පිරිවෙන් පනතට අනුව අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලය පිරිවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරේ. ඒ අනුව පිරිවෙන් පරිපාලනය හා නඩත්තුව සඳහා කෘත්‍යාධිකාරිවරයකු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කළ යුතුව ඇත. එම කෘත්‍යාධිකාරිවරයා පිරිවෙනෙහි සියලු පරිපාලන කටයුතු හා නඩත්තුව පිළිබඳ වගකිව යුතු ප්‍රධානියා වේ. කෘත්‍යාධිකාරිවරයාගේ බලතල හා කාර්ය හා කර්තව්‍ය පනතේ 24 වගන්තිය යටතේ මෙසේ දක්වා තිබේ.

I. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිරිවෙන සඳහා නියම කරනු ලබන සුදුසු හා ප්‍රමාණවත් ඉඩ පහසුකම්, ගෘහ භාණ්ඩ, උපකරණ, සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් සැලසීම.

II. නියම කරනු ලබන අධ්‍යාපනික හා සංස්කෘතික තත්ත්වයන් පිරිවෙනෙහි පවත්වාගෙන යාම.

III. පිරිවෙන් මණ්ඩලයෙහි අනුමැතියට යටත්ව පිරිවෙනෙහි පරිවේණාධිපතීන් වහන්සේ හා ආචාර්යවරයන් පත්කිරීම හා ඔවුන්ගේ සේවය නතර කිරිම.

IV. පිරිවෙන වෙනුවෙන් රජයේ අරමුදලින් ගෙවනු ලබන ආධාර මුදල් පිරිවෙනේ උපරිම යහපත සඳහා යෙදවීම.

V. පිරිවෙනේ සාමාන්‍ය පරිපාලනය හා නිසි නඩත්තු කිරීම සම්බන්ධයෙන් වගකීම.

VI. පිරිවෙනේ ආචාර්ය මණ්ඩලය වෙත පවරනු ලැබ ඇති කර්තව්‍ය හා කාර්ය ඒ ආචාර්ය මණ්ඩලය විසින් ඉටුකරනු ලබන බවට සහ කලින් කල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලව ඒ ආචාර්ය මණ්ඩලය ක්‍රියාකරන බවට වග බලාගැනීම.

මේ අනුව පිරිවෙන් පාලනය හා කළමනාකරණය පිළිබඳ සියලු බලතල කෘත්‍යාධිකාරීන් වහන්සේ වෙත රඳා පවතින බව පැහැදිලිය. බොහෝවිට පිරිවෙන පවත්වාගෙන යනු ලබන ආයතනයේ අධිපතීන් වහන්සේම කෘත්‍යාධිකාරිවරයාද වෙති. පනතේ නියමයන් කෙසේ සඳහන් වුවත්, මෙම නියමයන්ට අනුව කටයුතු කරන්නේ අතළොස්සක් දෙනා පමණක් බව ප්‍රත්‍යක්ෂ කාරණයකි. සමහර කෘත්‍යාධිකාරීන්වහන්සේගේ කාර්ය වන්නේ අවශ්‍ය වූ විට සිය අත්සන යෙදීම පමණි. ඇතැම් කෘත්‍යාධිකාරිවරු සිය නේවාසික විහාරස්ථානයේ නේවාසිකව වැඩ වෙසෙති. අදාළ පිරිවෙනේ සිට සැතපුම් සිය ගණනක් දුරින් එම විහාරස්ථාන පිහිටා ඇති අවස්ථාද අසන්නට ලැබිණි. ඒ හෙයින් ඔවුහු සිය ආයතනය පිළිබඳ වගකීම්වලින් ඈත්ව නාමිකව පමණක් කටයුතු කිරීම ශෝචනීය තත්වයකි. වර්තමානයේ ශ්‍රී ලාංකේය පිරිවෙන් පද්ධතියෙහි සාර්ථක මට්ටමින් පවත්වාගෙන යනු ලබන පිරිවෙන් ඇත්තේ ස්වල්පයකි. එම පිරිවෙන්හි සාර්ථකත්වය උදෙසා කෘත්‍යාධිකාරීවහන්සේලා තුළ පවතින දැනුම, ආකල්ප, කුසලතා මෙන්ම මනා දැක්මක් සහිත වීම, ශාසනික හැඟීම් සහිත වීම, කැපවීම, සේවයක් කිරීමට ඇති කැමැත්ත ආදිය බෙහෙවින් ඉවහල්ව පවත්නා බව නොරහසකි. ඒ අනුව පිරිවෙන් අධ්‍යාපනයේ අභිවෘද්ධියක් අපේක්ෂා කරන්නේ නම්, කෘත්‍යාධිකාරීන්වහන්සේගේ කාර්යභාරය පිළිබඳව යළි විමර්ශනයක් කිරීමත්, එකී ආයතනගත ඒක පුද්ගල කේන්ද්‍රීය කළමනාකරණ රටාව පිළිබඳව යළි විමර්ශනය කිරීමත් අත්‍යවශ්‍ය වේ.



## පරිවේණාධිපතීන් වහන්සේගේ කාර්යභාරය හා බැඳී පවතින දුර්වලතා

පිරිවෙන් පනතට අනුව පරිවේණාධිපතිවරයෙකු ලෙස පත්කිරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් අතර උපසම්පදාව ලබා වසර 05 ක කාලයක් ගතව තිබීම අවශ්‍ය වේ. එහෙත් ශාසනික විනය සම්ප්‍රදාය අනුව උපසපන් වී වසර 10 ක් ගතවනතුරු යම් භික්ෂුවකට ශිෂ්‍යයෙකු පැවිදි කිරීමටවත් අවසරයක් නොමැත. ශ්‍රමණ ආකල්ප වලින් පරිපූර්ණ භික්ෂු පිරිසක් හැඩගැස්වීමෙහිලා වූ පුළුල් කාර්යභාරය පරිවේණාධිපතිවරයාට පැවරෙන මූලික වගකීම වේ. එවන් වැදගත් කාර්යභාරයක් ඉටුකළ යුතු පරිවේණාධිපතිවරයා ලෙස කටයුතු කිරීමට උපසම්පදාවෙන් වසර 05 ක් ගතවීම සුදුසුයැයි තීරණය කොට ඇත්තේ කුමන පදනමක පිහිටාදැයි ගැටලුවක් මතුවේ. තවදුරටත් ශික්ෂණය ලැබිය යුතු අවස්ථාවක සිටින භික්ෂුවක වෙත භික්ෂු ශිෂ්‍යයන් පිරිසක් ශාසනික සම්ප්‍රදායෙහි හැඩගැස්වීම සඳහා යොමුකිරීම අනුචිත බව පැහැදිලි කාරණයකි. ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව පනතෙහි නියමයන් සම්බන්ධයෙන් ගැටලුවක් නොපෙනේ.

එසේම වර්තමාන පරිවේණාධිපතිවරයාගේ භූමිකාව රජයේ පාසලක විදුහල්පති භූමිකාව හා සමාන වන බව පෙනේ. පිරිවෙන් පනතට අනුකූලව පැනවෙන චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම, විධිමත්ව ආයතනය පවත්වාගෙන යාම ආදි කාර්යයන් පරිවේණාධිපතිවරයාට පැවරෙන වගකීම් අතරින් කිහිපයකි. හුදෙක් ලිපිලේඛනවලට පිළිතුරු සැපයීම, ආකෘති පත්‍ර පුරවා යැවීම හා විවිධ ලේඛන පවත්වාගෙන යාම ආදියට පමණක් ඇතැම් පරිවේණාධිපතිවරුන් සීමාවී සිටින බව අනාවරණය විය.

විශේෂයෙන් ඇතැම් කෘත්‍යාධිකාරිවරුන් විසින් පරිවේණාධිපතිවරුන්ට සිය භූමිකාව මැනවින් ඉටුකරලීමට සහාය නොදෙන අවස්ථාද ඇති බව මෙම අධ්‍යයනයේදී අනාවරණය වූ වැදගත් සාධකයකි. පරිවේණාධිපති සේවාවක් පිහිටුවා ඔවුනට නිසි පරිදි උසස්වීම් ක්‍රමයක් ලබාදීම,

කෘත්‍යාධිකාරිවරයා හට පැවරී ඇති බලතල මගින් ඇතිවන බාධා ඉවත් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම, පරිවේණාධිපතිවරයෙකු ලෙස පත්වීමක් ලබාදීමේදී දැනට පවත්නා පරිදි උපසම්පදාවෙන් වසර 05 ක් සපුරා තිබීම වෙනුවට වසර 10 ක් වත් ඉක්මවූ අයකු වීම ආදිය නව එළඹුම් ලෙස මෙහිදී යෝජනා කෙරේ.

භෞතික සම්පත් පහසුකම් අංශයෙන් ගත් කල්හිද පිරිවෙන් මහත් පරිහානිදායක තත්ත්වයක් ප්‍රකට කරයි. බොහෝවිට පිරිවෙන්හි පන්ති පවත්වාගෙනයාම සඳහා වෙනම ශාලා පහසුකම් නොමැත. එම පන්ති පවත්වනු ලබන්නේ විහාරස්ථ ධර්ම ශාලාවන්හිය. විධිමත්ව පන්ති පවත්වාගෙන යාමට හැම පිරිවෙනක් සඳහාම ශාලා පහසුකම් ලබාදීම රජයේ වගකීමක් වියයුතු බව අවධාරණය කළ යුතුය. එලෙස පිරිවෙන් සඳහා වෙනම ගොඩනැගිලි ඉදිකරවාදීම හා නඩත්තු කරලීම විහාරස්ථානයේ පැවැත්මටද හිතකර වේ. එසේම ඩෙස්ක් බංකු හා ලී බඩු ආදි අවශ්‍ය දෑ ලබාදීම සඳහා රජයේ මැදිහත්වීම අනිවාර්ය විය යුතු බවද අවධාරණය කෙරේ.

## අධ්‍යයන ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටලු

අධ්‍යයන ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටලු අතර විෂයය අධ්‍යයනයට පමණක් ශිෂ්‍යයන් යොමු කිරීමට යොමුවූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකට සීමාවීම වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයෙහි මූලික අවස්ථාවේ සිටම දැකගත හැකි දූර්වලතාවකි. ශාසනික චර්යාවන්හි නිරතවන පැවිද්දෙකු සතුවිය යුතු අනන්‍යතාව උදෙසා මගපෙන්වන න්‍යායික අවබෝධයක් හා ප්‍රායෝගික අත්දැකීම් ලබාගත හැකි පිළිවෙතක් පිරිවෙන්හි ක්‍රියාත්මක වන බවක් නොපෙනේ. ඒ සඳහා ඉදිරිපත් කළ හැකි හොඳම සාක්ෂිය වන්නේ ත්‍රිපිටක ධර්මය ඉගැන්වීම මූලික පිරිවෙනේ පන්ති පහකින් පසු අවසාන විමයි. ත්‍රිපිටකය යනු භික්ෂු ජීවිතයේ හැඩගැස්ම උදෙසා ගැඹුරින් හැදෑරිය යුතු ක්ෂේත්‍රයක් වන හෙයින් ඒ පිළිබඳව සමස්ත පිරිවෙන් අධ්‍යාපනය පුරාම දිවෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය.



මහ පිරිවෙන්හි ප්‍රාචීන විභාග සඳහා ඉගැන්වීම් සිදුකෙරේ. එසේම අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයටද සිසුන් සූදානම් කෙරේ. මෙම පිරිවෙන්හි වුවත් භික්ෂුවකගේ මූලික ශික්ෂණය අරමුණු කරගත් විෂයය පද්ධතියක් ක්‍රියාත්මක නොවීමද ප්‍රබල දූර්වලතාවක් ලෙස ගිණිය හැකිය.

## පිරිවෙන් පෙළපොත්හි පවත්නා අඩුපාඩු

අතීතයේ පිරිවෙන් අධ්‍යාපනය සඳහා පෙළපොත් ලෙස භාවිතයට ගැනුනේ මෙරට විද්වත් මහතෙරවරුන් හෝ විද්වත් ගිහි භවතුන් විසින් රචිත පාඨ ග්‍රන්ථයන්ය. උදාහරණයක් ලෙස පාලි භාෂාව ඉගැන්වීම සඳහා භාවිතයට ගැනුනේ අග්ගමහා පණ්ඩිත මහාචාර්ය පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් විසින් රචිත පාලි භාෂාවතරණය පොත් පෙළයි. පරදුව පදුමජෝති හා ලේල්වල අරියජෝති යන හිමිවරුන් විසින් රචිත පාලි කථා මඤ්ජුසා පොත් පෙළයි. විෂයය ඉගෙනීම සඳහා ශිෂ්‍යයන් පෙළඹවීමට මෙන්ම ශිෂ්‍ය රුචිය වර්ධනය කරලීමට සමත් මෙම ග්‍රන්ථ වර්තමාන පිරිවෙන් පෙළපොත් රචනාකොට හඳුන්වාදීමත් සමගම භාවිතයෙන් ඈත්වෙමින් පවතී. එම පෙළපොත් ශිෂ්‍ය ස්වභාවය හා ශිෂ්‍ය අභිරුචිය හඳුනාගෙන රචනාකර ඇති බවක් නොපෙනේ. පාලි භාෂාව මෙන්ම සංස්කෘත භාෂාව සඳහා නිර්දිෂ්ට පෙළපොත්හි 5 වැනි වසර සඳහා නියමිත පෙළපොත් ඇතැම් විශ්වවිද්‍යාලයන්හි උපාධි අපේක්ෂකයන් සඳහා පරිශීලනය සඳහා උචිත බවට මතයක් පවතී. ඒ නිසා අතීතයේ පිරිවෙන් අධ්‍යාපනය සඳහා භාවිතා කළ පාලි භාෂාවතරණය, පාලි කථා මඤ්ජුසා, සංස්කෘත, බාලාදර්ශය, ප්‍රථමාදර්ශය, ද්විතීයාදර්ශය වැනි සම්භාවිත පෙළ පොත් භාවිතයට යොමුවීම සාධනීය වේ.

## පැරණි වාචනා ක්‍රමය යළි භාවිත කිරීම

බුද්ධ දේශිත ධර්ම විනය සංරක්ෂණය කොට පවත්වා ගෙන යාමේ මහඟු කාර්යයට උරදුන්නෝ දැන උගත් භික්ෂූන් වහන්සේ වූහ. එම කාර්යයෙහිලා දායකත්වය සැපයූවෝ භාණක නම්

වෙති. මහින්දාගමනයත් සමග ලංකාවට පැමිණි භික්ෂූන් මෙන්ම උන්වහන්සේලාගෙන් ධර්මය උගත් භික්ෂු පිරිස ද සිය ප්‍රධාන ඉගෙනීමේ ක්‍රමය ලෙස භාවිත කළේ වාචනා මාර්ගය පමණි. ලේඛන ක්‍රමය බිහිවූ පසු විවිධ ග්‍රන්ථ පළවුවත් ධර්ම විනය ඉගෙනීමේ මූලික ක්‍රමවේදය වූයේ වාචනා ක්‍රමයයි. ඒ අනුව අතීතයේ භික්ෂූන් වහන්සේලාගේ ධර්මධර බව හා විනයධර බව සඳහා දායකත්වය සැපයූ ආයතනය වූයේ පිරිවෙනයි. වනපොත්කරණය හෙවත් පරිවහනය (කට පාඩම් කිරීම) ප්‍රමුඛ වූ පිරිවෙන් අධ්‍යාපනය මගින් ත්‍රිපිටකාගත ධර්මය මෙන්ම අටුවා, ටීකා, ටිප්පණි, ප්‍රකරණ ආදිය පිළිබඳව ශිෂ්‍ය භික්ෂූන් වෙත දැනුම ලබාදී ඇත. ඒ අනුව පිරිවෙන යනු උද්ගහණ, ධාරණ, පරිවහන, සජ්ඣායන ආදි සියලු අධ්‍යයන කාර්යයන් සිදුකළ ප්‍රධාන ආයතනය ද විය. වනපොත්කරණය මගින් අධ්‍යාපනය ලබාදීම පැරණියේ සිට අතිශයින් සම්භාවිත ඉගැන්වීම් ක්‍රමයක් ලෙස සැලකේ. අතීතයේ සිට භික්ෂු අධ්‍යාපනය සඳහා මෙම ක්‍රමය බහුල වශයෙන් භාවිතයට ගැණිනි. පැවිදිවීමට අපේක්ෂාවෙන් පසුවන පණ්ඩුපලාසයා විසින් පවා ඇණවුම් සකස්කඩ, සතර බණවර, ධම්මපදය ආදිය වනපොත් කළ යුතු වූ බව දඹදෙණි කතිකාවතෙන් අනාවරණය වේ. මහලු පැවිද්දන් (උපසම්පදා වූ එහෙත් නිස්සයමුත්තක නොවූ) විසින් පවා වනපොත් කිරීම කළ යුතු විය.

අතීත භික්ෂූන් වහන්සේලා මේ ක්‍රමය භාවිතය මගින් බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ බවට පත්වූහ. ධර්මදේශනා සඳහා මෙන්ම ශාස්ත්‍රීය කාර්යන්හිද මෙමගින් ලද දැනුම බෙහෙවින් උපයෝගී කරගත් ආකාරය දැකගත හැකිය. වර්තමානය වන විට තුන් සූත්‍රයවත් මතකයෙන් නිවැරදිව සජ්ඣායනා කිරීමට නොහැකි භික්ෂූන් බහුලව සිටීම පිරිවෙන් අධ්‍යාපනයෙන් වනපොත්කරණය ඇත්වීමෙන් ඇති වූ ප්‍රතිඵලයන් ලෙස ගත හැකිය. එහෙත් මේ වන විට කට පාඩම් කිරීමේ ක්‍රමය ඉගැන්වීමේ ක්‍රමයක් ලෙස භාවිතයට ගනුයේ අතළොස්සක් වූ පිරිවෙන් කිහිපයක පමණි. මේ බව විවිධ රූපවාහිනී, ගුවන් විදුලි නාලිකා මගින් විකාශනය වන ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා



මගින් පැහැදිලි වේ. වනපොත්කරණය මගින් ත්‍රිපිටකාගත ධර්මය මැනවින් හදාළ බහුශ්‍රැත පඬිවරු හා තෙරවරු එකී දේශන හා සාකච්ඡා මනාව හසුරුවීමෙහි කුසලතා ඇත්තෝ වෙති. එවැනි කුසලතා නැත්තෝ වචන හරඹ පමණක් දක්වති. පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය තුළ යම්තරමකින් මෙම ඉගැන්වීම් ක්‍රමය ඇතැම් තැන්හි ක්‍රියාත්මක වෙතත් ඒ අතළොස්සක් තරම් වූ ආයතන කිහිපයක පමණක් බව පැහැදිලිය. මේ සඳහා යළි යොමුවීම අගනා ප්‍රවේශයක් බව පැවසිය යුතුය.

## නූතන විෂයයන් පිළිබඳව අධ්‍යාපනය ලබාදීම

21 වැනි සියවසේ ලොව සිදුවන විවිධ විපර්යාසයන් හමුවෙහි භික්ෂු අධ්‍යාපනය සඳහා වූ පිරිවෙන් අධ්‍යාපනයෙහි ද යම් යම් වෙනස්කම් ඇතිකරලීම අත්‍යවශ්‍ය වේ. උදාහරණයක් ලෙස ඉංග්‍රීසි භාෂා කුසලතාව නූතන යුගයේ ප්‍රබල අවශ්‍යතාවක් ලෙස සැලකේ. එසේම පරිගණක භාවිතය පිළිබඳ දැනුම ද එවැනිම අත්‍යවශ්‍ය වූවකි. පිරිවෙන් ආයතනයන්හි වඩාත් අඩු අවධානයක් යොමුවන විෂයයක් ලෙස ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය හඳුන්වාදීම නිවැරදිය. නූතන භාෂා දැනුමෙහි ඌනතාව නිසා අධ්‍යාපනික වශයෙන් මෙන්ම සාමාජීය වශයෙන්ද ඇතැම්විට භික්ෂූන් පසුගාමී තත්වයකට ඇද වැටෙන ආකාරය දැකගත හැකිය. මේ අනුව ඉංග්‍රීසි, ජපන්, චීන, කොරියන් ආදි නූතන භාෂා පිළිබඳව අධ්‍යාපනය ලබාදීම ශාස්ත්‍රීය වශයෙන් මෙන්ම ශාසනික වශයෙන් ද වැදගත් ප්‍රවේශයක් ලෙස හඳුන්වා දිය හැකිය.

වර්තමාන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියෙහි පවත්නා පූර්වෝක්ත දුබලතා මනාව හඳුනාගත් අවස්ථාවක් ලෙස 2002 වර්ෂයේ රජය විසින් පත්කරන්නට යෙදුණ බුද්ධශාසන ජනාධිපති කොමිෂන් සභා වාර්තාව පිළිබඳව අවධානය යොමුකිරීම අත්‍යවශ්‍ය වේ. එම වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපනය සඳහා කළ යෝජනාවන් පිළිබඳව මෙතෙක් අවධානය යොමු නොවීම විමතියට මෙන්ම කණගාටුවටද කරුණකි.

බුද්ධශාසන කොමිසම විසින් යෝජිත භික්ෂු අධ්‍යාපන ක්‍රමය එම යෝජනා අනුව භික්ෂු අධ්‍යාපන ආයතනයන්හි සංයුතිය මෙසේය.

### සාමණේර ආයතන

බුද්ධශාසන ජනාධිපති කොමිසම මගින් යෝජිත භික්ෂු අධ්‍යාපන ක්‍රමයේ පදනම ලෙස සාමණේර ආයතනය දැක්වේ.

මෙලෙස සාමණේරායතනයක සාමණේරයන් ලබන පුහුණුව පිළිබඳ අධීක්ෂණ කටයුතු දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයකට පැවරිය යුතු බව යෝජිතය. මෙලෙස පුහුණුවන සාමණේරවරුන් පොදු ලිඛිත පරීක්ෂණයකට මෙන්ම ප්‍රායෝගික පරීක්ෂණයකට ද යොමුකළයුතු වේ. යෝජිත දෙවන තලයේ අධ්‍යාපනය ලැබීම සඳහා මෙම සාමර්ථ්‍යය අනිවාර්ය වේ. සාමණේරායතනයේ වසර දෙකක පුහුණුවෙන් පසු පුහුණු සහතිකයක් පිරිනැමේ. අනතුරුව සාමණේරයන්ට තම අභිමතය හෝ ආචාර්ය උපාධ්‍යාය ස්වාමීන් වහන්සේලාගේ අභිරුචිය මත වැඩිදුර අධ්‍යාපනය සඳහා තෝරාගත හැකි විෂය ධාරා දෙකක් නිර්දේශ කොට ඇත. එනම්,

1. පිරිවෙන් හා
2. භික්ෂු පුහුණු නිකේතන

### පිරිවෙන්

දැනට ක්‍රියාත්මක වන මූලික, මහ, විද්‍යායතන යන පිරිවෙන් වර්ග කිරීම ඉවත් කිරීමට යෝජනා කෙරේ. ඒ අනුව සියලුම පිරිවෙන් "පිරිවෙන" නමින් හැඳින්වීමට යෝජිතය. මේ අනුව එකම පිරිවෙනකදී පහ වසර දක්වා ඉගෙන අවසාන වූ පසු, මූලික පිරිවෙන් අවසාන විභාගයට පෙනී සිටීමට අවස්ථාව සැලසේ. අනතුරුව එම පිරිවෙනෙහිම තවදුරටත් අධ්‍යාපනය ලබමින්, ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම, අවසාන විභාගයන්ට පෙනී සිටීමට ඉඩ ලැබේ.



මෙම ප්‍රතිසංස්කරණයේදී පිරිවෙන් මූලික පස්වසර ප්‍රතිසංවිධානය කළ යුතු බවට යෝජනා කෙරේ. එහි විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉතිහාසය, හා ගණිතය අනිවාර්ය වූවක් විය යුතුය. පිරිවෙන් වසර පහ අවසානයේ වර්තමානයේ මෙන්ම මූලික පිරිවෙන් අවසාන විභාගය සඳහා පෙනී සිටිය යුතුය. එය සමත්වීම පිරිවෙන් විෂය ධාරාවේ තවදුරටත් ඉගෙනීම සඳහා අනිවාර්ය සුදුසුකමක් වේ. මෙම යෝජනාවන්හි විශේෂ ලක්ෂණයක් ලෙස භික්ෂු ආචාර සමාචාර සංවර්ධනය පිරිවෙන් අධ්‍යාපනයේ අනිවාර්ය අංගයක් වීම දැක්විය හැකිය.

### භික්ෂු පුහුණු නිකේතන

භික්ෂු පුහුණු නිකේතන දෙවැදෑරුම්ය.

I. උත්තර භික්ෂු පුහුණු නිකේතන

II. මහා විහාර උත්තර භික්ෂු පුහුණු නිකේතන

### I. උත්තර භික්ෂු පුහුණු නිකේතන

සාමණේරායතනයේ පුහුණුවෙන් පසු පිරිවෙන් ධාරාවට යොමු නොවන භික්ෂූන් සඳහා උත්තර භික්ෂු පුහුණු නිකේතන ඇති කෙරේ. එවැනි අධ්‍යාපන ආයතන පළාතකට එක බැගින්වත් ඇති කළ යුතු බවට යෝජිතය.

එම ආයතනයේදී පහත සඳහන් විෂයමාලාව හැදෑරීමට අවකාශ සැලසිය යුතුය.

- සිවුරු සකස්කරගැනීම
- පිළිම ඇඹීම
- චිත්‍ර ඇඳීම

- කුදුමහත් ආරාමික කටයුතු හා විවිධ වත්පිළිවෙත් පිළිබඳ පුහුණුව
- භක්තානුමෝදනා
- භුක්තානුමෝදනා
- පිරිත් අනුශාසනා
- ධර්ම ඥානය
- භාෂා ඥානය
- පාංශුකූල ධර්මදේශනා
- රාත්‍රි ධර්මදේශනා
- ආසන්න ධර්මදේශනා
- නවීන තාක්ෂණ අධ්‍යයනය

මෙම පාඨමාලාව පස් අවුරුදු කාලයකට යටත්වන අතර පාඨමාලාව අවසානයේ විභාග පවත්වා සහතික පිරිනැමේ.

මෙම භික්ෂු පුහුණු ආයතනයේ කාර්යභාරය තුළින් ශාසනික සම්ප්‍රදායන් ආරක්ෂාගැනීම හා ශාසනික වත් පිළිවෙත් පිළිබඳව මහත් අවධානයක් යොමුකොට ඇති බව පැහැදිලිය. ධර්ම ශාස්ත්‍රෝද්ගහණය සඳහා සහජ හැකියාවක් නොමැති භික්ෂූන් ශාසනය තුළ රඳවා ගනිමින්, ශාසනස්ථිතිය සඳහා යොමුකරලීමට ගනු ලබන උත්සාහයක් මෙම විෂයමාලාව තුළින් ප්‍රකට වේ.

උත්තර භික්ෂු පුහුණු නිකේතන මගින් විහාරස්ථානයන්හි පැවැත්ම හා දියුණුව උදෙසා අවශ්‍ය බෞද්ධ කලා ශිල්පයන්හි භික්ෂූන් යොමුකරවීමට අපේක්ෂා කෙරේ. සිවුරු මැසීමේ කාර්ය භික්ෂුවක විසින් අනිවාර්යයෙන්ම උගත යුත්තකි. වර්තමානයේ පවත්නා පහසුකම් නිසා මසන ලද සිවුරු බහුලය. එවැන්නක් මිලට ගැනීම හෝ පූජාවට ලැබීම නිසා මෙම කටයුත්තේ යෙදෙන භික්ෂූහු අල්පය. කඨින චීවර මාසය තුළ විහාරස්ථානයන්හි කඨින චීවරය මෙන්ම සිවුරු මැසීම සඳහා සකස් කරන්නේ ද, මසන්නේ ද බොහෝ විට ගිහියන් විසිනි. අතීතයේ ශ්‍රී ලංකාවේ විහාරස්ථානයන්හි වැඩ සිටි මහ තෙරවරුන් පවා විහාරස්ථානයකට අවශ්‍ය කොසු, ඉදල්, පාපිසි වැනි භාණ්ඩ සකසාගැනීමෙහි නිරත වූ වග වර්තමානයේ බොහෝ දෙනා නොදනිති.



පිළිම ඇඹීම, විහාර සිතුවම් ඇඳීම වැනි ශිල්පීය කාර්යයන් සඳහා සහජ කුසලතා සහිත භික්ෂූන් හඳුනාගෙන ඔවුන් ඒ සඳහා යොමුකරලීමට යෝජනා කිරීමම වැදගත් ප්‍රවේශයකි.

උත්තර භික්ෂු නිකේතනයන්හි විෂය මාලාව භික්ෂු ජීවිතයේ ප්‍රායෝගික ස්වභාවය මනාව හඳුනාගත් අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. පැවිදි ජීවිතය තුළ විවිධ ආගමික වත් පිළිවෙත්හි නිරතවීමට සිදුවේ. ඒ අතර විශේෂයෙන් ආගමික කාර්යයන්හිදී ගිහි පිරිස් හා සම්බන්ධව කටයුතු කිරීමට සිදුවන ප්‍රායෝගික අවස්ථාව බහුලය. ඒවා නම් භක්තානුමෝදනා, භුක්තානුමෝදනා, පාංශකූල ධර්මදේශනා, පිරිත් අනුශාසනා, ආසන්න ධර්මදේශනා, රාත්‍රි ධර්මදේශනා ආදියයි. එම කාර්යයන් සම්පූර්ණ කිරීම උදෙසා කුසලතා පිරි ව්‍යක්ත දේශකයන් හැඩගැස්වීම අතිශයින් වැදගත් එළඹුමකි. එසේම ඒ සඳහා අවැසි භාෂා ඥානය වර්ධනය කරලීමත්, ධර්ම ඥානය වර්ධනය කරලීමටත් අවධාරණය වී ඇත. ආගමික කාර්යයන් සඳහා නූතන තාක්ෂණික මෙවලම් භාවිතය සඳහා පුහුණුව ලබාදීමට යෝජනා කිරීමද ඵලදායි කාර්යයක් බව සඳහන් කළ යුතුය.

## II. මහාවිහාර උත්තර භික්ෂු පුහුණු නිකේතන

උත්තර භික්ෂු පුහුණු නිකේතනයේ පස් අවුරුදු පාඨමාලාව සමත්ව සහතිකය ලද, අයට හා පිරිවෙන් අධ්‍යාපන ධාරාවේ ප්‍රාචීන ප්‍රාරම්භ හා මධ්‍යම විභාග සමත් අයටද, යෝජිත මහ විහාර උත්තර භික්ෂු නිකේතනයේ පුහුණුව ලද හැකිය. මෙම ආයතනය භික්ෂූන් සඳහාම වෙන්වූවකි. මෙහි පාඨමාලා කාලය වසර තුනක් වේ. ධර්මදූත සේවා, ප්‍රජාසේවා, ධර්ම පර්යේෂණ, ප්‍රජා නායකත්වය, විහාර පරිපාලනය පිළිබඳ පුහුණුවක් ලබාදීමට යෝජනා කෙරේ.

මෙම ආයතනයේ පළමු වසර හා දෙවැනි වසර පොදු විෂයන් සඳහා වෙන් කෙරේ. තෙවන වසරේදී ඔවුන් යෝජනා කරන්නේ ධර්මදූත සේවා, ප්‍රජාසේවා හෝ ධර්ම පර්යේෂණ හෝ තෝරාගත් විෂය ක්ෂෙත්‍රයකට අදාළ ශාස්ත්‍රීය හා ප්‍රායෝගික උසස් අධ්‍යාපනයක් ලබාදීමටය. මෙම ආයතනය තුළ පාලි,

සංස්කෘත, චීන, ජර්මන්, ඉංග්‍රීසි, දෙමළ ආදි භාෂා හැදෑරීම සඳහා ජාත්‍යන්තර භාෂා අධ්‍යාපන පීඨයක් ද ආරම්භ කළ යුතු බවට නිර්දේශ කෙරේ. පළමු හා දෙවන වසරට යෝජිත පොදු විෂයමාලාව යටතේ පහත සඳහන් ක්ෂෙත්‍ර පිළිබඳව හඳුන්වාදීම් කළ යුතුය.

- විදේශ භාෂාවන්හි මූලික කරුණු
- කළමනාකරණ මූලධර්ම
- නවීන තාක්ෂණයේ ව්‍යාප්තිය හා ඉන් ලද හැකි ප්‍රයෝජන
- ආණ්ඩු ක්‍රම
- බුද්ධ ශාසනයට අදාළ අණ පනත්
- ආර්ථික විද්‍යා න්‍යාය ධර්ම
- පරිගණක භාවිතය
- සන්නිවේදන විධි
- නායකත්ව පුහුණුව හා විහාර පාලනය
- ශාසනික ඉතිහාසය
- විචාරාත්මක දේවධර්ම අධ්‍යයනය

(අනිවාර්ය විෂය)

මෙම පාඨමාලාව සාර්ථකව නිමාකරන භික්ෂූන්ට මහා විහාර විද්‍යා විශාරද සහතිකය පිරිනැමීමට නිර්දේශිතය.

පෙර සඳහන් කළ පරිදි, මහා විහාර උත්තර භික්ෂු පුහුණු නිකේතනයේදී ඉගැන්වීමට යෝජිත විෂයමාලාව ද පුළුල් දැක්මකින් යුතුව සකස් කරන ලද්දක් බව පෙනේ. භික්ෂූන් සඳහා පමණක්ම වෙන්වූ මෙම ආයතනයේ තුන් අවුරුදු පාඨමාලාවක් පැවැත්වේ. විෂය මාලාව පොදු හා අනිවාර්යය විෂය මාලාව වශයෙන් දෙයාකාර වේ.

පොදු විෂය මාලාවේ අන්තර්ගතය වර්තමාන භික්ෂු ජීවිතය හා බෙහෙවින් අදාළ වේ. මේ වන විට විශේෂයෙන් යුරෝපීය රටවල බුදුදහම කෙරෙහි මහත් අවධානයක් යොමු වී පවතී. එවැනි රටවල්හි බුදුදහම ප්‍රචලිත කිරීමේදී මතුවන ප්‍රබල ගැටලුව



වන්නේ කුසලතා පූර්ණ ධර්ම සන්නිවේදක භික්ෂූන්ගේ හිගකමයි. ඒ සඳහා මූලික යොමුවීමක් ලෙස විදේශීය භාෂාවන් පිළිබඳ දැනුම ලබාදීම අගය කළ යුතු යෝජනාවකි. නූතන භික්ෂුව යනු සැබවින්ම පවත්නා සමාජය පිළිබඳ පූර්ණ දැනුමැති අයකු වීම අත්‍යවශ්‍ය වේ. කළමනාකරණය පිළිබඳ දැනුමින් යුතුවීම භික්ෂු ජීවිතයක පූර්ණත්වය සඳහා වැදගත්ය. සිය විහාරස්ථාන සතු භෞතික හා මානව සම්පත් කළමනාකරණය සඳහා බෞද්ධ කළමනාකරණ මූලධර්ම දැනගැනීම සඳහා අවස්ථාව සලසා දීම අගය කළ හැකිය. නූතන තාක්ෂණික මෙවලම් භාවිත කුසලතා සහිත භික්ෂූන් වහන්සේලාට ධර්ම සන්නිවේදනමය හා ධර්ම සම්ප්‍රේෂණමය කාර්යභාරය මනාව සපුරාගත හැකිවේ. අතීත භික්ෂුව මෙන් නොව වර්තමාන භික්ෂුව සමාජගත වූ සමාජ ජීවියෙකු වශයෙන් සමාජය හා බද්ධව කටයුතු කරන්නෙකි. එහෙයින් දේශපාලනය හා බැඳි ආණ්ඩුක්‍රම වැනි විෂයන්හි ද, ආර්ථික විද්‍යා හා න්‍යාය, පරිගණක තාක්ෂණය, ජන සන්නිවේදන විෂයබද්ධ මූලධර්ම ආදිය පිළිබඳව මනා දැනුමකින් යුතුවීම අත්‍යවශ්‍ය වේ. භික්ෂුව තමා හා සම්බන්ධ ශාසනික ඉතිහාසය, ශාසනික සම්ප්‍රදායන්, ශාසනික පිළිවෙත් ආදිය ගැන මනා දැනුවත්වීමකින් යුතු විය යුතුය. එසේම බුද්ධ ධර්මය හැරුනු විට, අනෙකුත් සමයාන්තර දර්ශන පිළිබඳ මනා අධ්‍යයනයක නිරත විය යුතුය. විශේෂයෙන්ම ක්‍රිස්තු ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය වැනි දර්ශනයන් පිළිබඳ දැනුවත් බවකින් යුතුවීම කාලීන අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන තිබීම මෙම යෝජනාවන්ගේ විශිෂ්ටත්වය ප්‍රකට කරන්නකි.

මෙම නිර්දේශයන් අනුව පිරිවෙන් අධ්‍යාපනය සංශෝධනය කිරීම තබා ඒ යෝජනා පිළිබඳව අවධානයවත් යොමුකිරීමට රාජ්‍ය අධ්‍යාපන බලධාරීන් මෙන්ම ශාසනික බලධාරීන් ද අසමත්වීම අභාග්‍යයකි. මෙම යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිද යන්න පිළිබඳව විමර්ශනය කිරීම වැදගත්ය. එසේ විමර්ශනය කොට ක්‍රියාත්මක කිරීම සිදුකරන්නේ නම් පවත්නා පරිහානිදායක තත්ත්වයෙන් පිරිවෙන් අධ්‍යාපනය සාධනීය ප්‍රවේශයකට යොමුකරලීමට හැකිවනු ඇතැයි සිතේ.

## සමාලෝචනය

ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපනය සඳහා යෝජිත නව එළඹුම් පිළිබඳව ඉහතදී අවධාරණය කෙරිණි. ඒ එළඹුම් අතරින් බොහෝමයක් ක්‍රියාත්මක කළ හැකි ඒවා බව සඳහන් කළ යුතුය. සැබවින්ම පිරිවෙන් පවත්වාගෙනයාමේ මූලික අරමුණු සාක්‍ෂාත් වන අයුරින් අධ්‍යාපන හා කළමනාකරණමය ක්‍රියාවලිය නවීකරණය කිරීමටත්, ඒ සඳහා උචිත ක්‍රමවේද සකසා ගැනීමටත් ශාසනික වගකීම් දරණ භික්‍ෂූන් වහන්සේලාගේ මෙන්ම පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ බලධාරීන්ගේ අවධානය යොමුවීම කාලීන අවශ්‍යතාවක් බව පැහැදිලිය.

වර්තමාන පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය අදාළ පරමාර්ථ සාධනයෙහි ලා සපුරා අපොහොසත් වී ඇති බව ප්‍රත්‍යක්‍ෂ කාරණයකි. භික්‍ෂු ජීවිතයෙහි සාඵල්‍යය උදෙසා ලද යුතු ප්‍රතිපත්ති, ආකල්පමය ශික්‍ෂණය සහිත පැවිදි පිරිසක් බිහිකරලීමට එම අධ්‍යාපන සම්ප්‍රදාය අසමත් වූ ආකාරය පිළිබඳ වූ සහේතුක නිදර්ශන සංඛ්‍යාත්මක වශයෙන් අප්‍රමාණය. සංසන්දනාත්මකව අධ්‍යයනයක යෙදෙන කල ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ගිහි අධ්‍යාපනයෙන් පිරිවෙන් අධ්‍යාපනය වෙනස් බවක් පෙන්නුම් කරයි. එහෙත් ඒ වෙනස්කම දක්නට හැක්කේ සුළු වශයෙනි. පිරිවෙන් පනතෙහි පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු පැහැදිලිව සඳහන්ව තිබුණත්, එකී පරමාර්ථ සාක්‍ෂාත් වන පරිදි අධ්‍යයන - අධ්‍යාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන්නේ අතළොස්සක් පමණ වූ පිරිවෙන් කිහිපයක පමණි.

විද්‍යායතන වශයෙන් හඳුන්වනු ලබන පිරිවෙන් ලෞකික පරමාර්ථ සාධනය උදෙසාම පමණක් වෙන් වූ ආයතන ලෙස පවත්වාගෙන යන අයුරුද පැහැදිලිය. එහෙයින් භික්‍ෂු ජීවිතයේ මූලික අභිමතාර්ථ සාධනය වන අයුරින් පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය යළි සැකසිය යුතු කාලය එළඹ ඇත. බුද්ධ ශාසන කොමිසන් සභා වාර්තාවේ සඳහන් සියලුම යෝජනා එලෙසම



ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික වශයෙන් දුෂ්කර කාර්යයක් විය හැකිය. එනමුත් එම යෝජනාවලියේ බෙහෙවින් සාධනීය යෝජනා ඇතුළත් බව පැහැදිලිය. එම යෝජනා කෙරෙහි අවධානය යොමුකරලීම වැදගත්ය. විහාරස්ථානයක් පාසා විවිධ අරමුණු සහිතව පිරිවෙන් ආරම්භ කිරීම මගින් පමණක් භික්‍ෂු අධ්‍යාපනය ඵලදායි නොවන බව ද පැවසිය යුතුය. පිරිවෙන් පවත්වාගෙන යාමේ මූලික අරමුණු සාධනය වන පිරිදි පිරිවෙන් අධ්‍යාපනය යළි සකස් කළ යුතුය. ඒ සඳහා උචිත ක්‍රමවේද සකසා ගැනීම රජයේ මෙන්ම ශාසනික බලධාරීන්ගේ ද වගකීම වන බව අවසන් වශයෙන් සඳහන් කළ යුතුය.

## ආන්තික සටහන්

1. පරණවිතාන, සෙනරත්, ලංකාවේ අධ්‍යාපන I, (සියවස ප්‍රකාශන) - *මහා විහාරය හා බොහෝ පැරණි විද්‍යා පීඨ නම් ලිපිය*, කොළඹ, 1969, පිටුව 49

2. පේමරතන නාහිමි, වරාගොඩ, පටිපදා (ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායික 66 වැනි උපසම්පදා පූණ්‍යෝත්සව සමරු ශාස්ත්‍රීය සංග්‍රහය), *වර්තමාන ශ්‍රී ලංකාවේ භික්‍ෂු අධ්‍යාපනය පිළිබඳ ප්‍රත්‍ය වේෂණයක්*, 2008, පිටුව 153

3 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනත

4 I පිරිවෙන් පනත පිටුව 5
II 1980 අංක 01 දරණ පිරිවෙන් අධ්‍යාපන නියෝග

5 - එම -

6 - එම -

7 පේමරතන නාහිමි, වරාගොඩ, පටිපදා ....... පිටුව 157

8 අරියවිමල හිමි, කොස්වත්තේ, ගුරු මැදුර - 3, වර්තමාන භික්‍ෂු අධ්‍යාපනය සැලසුම් කිරීමෙහිලා උපයෝගි කරගත හැකි සූත්‍ර පිටකාගත ඉගැන්වීම්.

9 බුද්ධශාසන ජනාධිපති කොමිෂන් වාර්තාව, 2002, පිටු 60 - 68.